# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
# මහජන ආරක්ෂක අමාත්‍යාංශය
# ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

# ප්‍රසම්පාදනය අවලංගු කිරීමේ දැන්වීම

**පහත සඳහන් ටෙන්ඩරය අවලංගු කර ඇති බව සියලුම ලංසුකරුවන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.**

**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සඳහා ඉලෙක්ට්‍රොනික විදේශ ගමන් බලපත්‍ර (ඉ-ගමන් බලපත්‍ර) 5,000,000 ක් සහ 'N' කාණ්ඩයේ යන්ත්‍ර මගින් කියවිය හැකි හිස් විදේශ ගමන් බලපත්‍ර ('N' Series blank Machine Readable Passports [MRPs]) 500,000 ක් ප්‍රසම්පාදනය.**

1. **2023-06-12** දිනැති පුවත්පත් දැන්වීම සහ **2023-07-06** දිනැතිව පළ කරන ලද අභිලාෂය ප්‍රකාශ කිරීම ඉදිරිපත් කිරීමේ දිනය දීර්ඝ කිරීමේ දැන්වීමට අනුව ඉහත සඳහන් ප්‍රසම්පාදනය සම්පූර්ණයෙන්ම අවලංගු කළ බව සියලුම ලංසුකරුවන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. මින් පෙර පළ කරන ලද දැන්වීම අපගේ නිල වෙබ් අඩවිය **(www.pubsec.gov.lk)** මගින් ලබා ගත හැකිය.

2. මේ සම්බන්ධයෙන් වන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ඉහත ප්‍රසම්පාදනය ඉල්ලා අස් කර ගැනීමට තීරණය කර ඇත. **2023-07-19** දින සිට බල පැවැත්වෙන පරිදි මෙතෙක් සිදු කරන ලද සියලුම ප්‍රසම්පාදන කාර්යයන් අවලංගු වන බව සියලුම ලංසුකරුවන් වෙත මෙයින් දැනුම් දෙනු ලබන අතර අභිලාෂ ප්‍රකාශ කිරීමට අදාළව ලේඛන මිල දී ගත් පාර්ශවයන් හෝ ආයතන මගින් මහජන ආරක්ෂක අමාත්‍යාංශය වෙත ගෙවන ලද **ශ්‍රී ලංකා රුපියල් පනස්දහසක (රු.50,000.00)** ආපසු නොගෙවන මුදල නැවත ගෙවනු ලැබේ.

3. එම **රුපියල් 50,000.00** ක මුදල ලබාගැනීම සඳහා අභිලාෂ ප්‍රකාශ කිරීමට අදාළව ලේඛන මිල දී ගත් පාර්ශවයන් හෝ ආයතන සිය ආයතනයේ ලිපි ශීර්ෂය යටතේ ඉල්ලීමක් **ca@pubsec.gov.lk** වෙත ඊ මේල් මගින් යොමු කරන ලෙස දැනුම් දෙනු ලැබේ.

4. ඔබ දැක් වූ උනන්දුව සම්බන්ධයෙන් අපගේ ස්තූතිය ප්‍රකාශ කර සිටින අතර මෙකී ප්‍රසම්පාදනය අවලංගු කිරීම හේතුවෙන් මතුවන යම් අපහසුතාවයක් ඇත්නම් ඒ පිළිබඳව අපගේ කණගාටුව ප්‍රකාශ කර සිටීමට කැමැත්තෙමු.

5. අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ප්‍රසම්පාදන කමිටුවේ ලේකම් වෙතින් දුරකථන අංක: **+94112887697/+94112887307** (දිගුව: **307**), ෆැක්ස්: **+94112887784** ඊමේල්: **ca@pubsec.gov.lk** ලිපිනය මඟින් මේ පිළිබඳ වැඩිදුර තොරතුරු ලබාගත හැකිය.

**සභාපති,**
**අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව (CAPC),**
**මහජන ආරක්ෂක අමාත්‍යාංශය,**
**14 වන මහල, "සුහුරුපාය",**
**ශ්‍රී සුභූතිපුර පාර,**
**බත්තරමුල්ල,**
**ශ්‍රී ලංකාව.**